බණ්ඩාර, නිලන්ති
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

*Paper: Equity*

## මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන කෑගල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසිකත්වය

සබරගමු පළාතට අයත් කෑගල්ල දිස්ත්‍රික්කය ප්‍රාග් ඓතිහාසික වශයෙන් මෙන් ම ඓතිහාසික වශයෙන් ද වැදගත්කමක් ගන්නා ස්ථානයක් ලෙස හැඳින්විය හැකිය. අළුලෙන, මානියංගම බෙලිලෙන, දොරවක කන්ද වැනි ප්‍රාග් ඓතිහාසික ගල් ලෙන්වලට අමතරව පදියගම්පොළ, යටහලෙන වැනි මූල ඓතිහාසික හා ඓතිහාසික ජනාවාස තුළින් ද ඒ බව පැහැදිලි වෙයි.

ක්‍රිස්තු පූර්ව යුගයේ පටන් මිනිසා ජනාවාස පිහිටුවා ගැනීමේ දී සාරවත් පස, ගංගා ජලය එක්රැස් කිරීමේ හැකියාව යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් උතුරු මැද, නැගෙනහිර හා වයඹ පළාත් ආශ්‍රිත ජනපද පිහිටුවාගත් බව *මහාවංසය* වැනි ලිඛිත මූලාශ්‍රවලින් මෙන් ම ශිලාලේඛනවලින් තහවුරු වේ (Paranavitana, 1970). මීට අමතරව කෑගල්ල වැනි තෙත් කලාපීය ප්‍රදේශ ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගැනීමේ දී කෘෂිකාර්මික කටයුතු සඳහා ඉහළ වර්ෂාපතනයක් ලැබීම මෙන්ම ඇතැම්විට කුඩා ප්‍රමාණයේ ජල පාලන ක්‍රම කෙරෙහි ද අවධානය යොමු කෙරිණ. (Gunawardana 1982). ඒ සඳහා භූගත සම්පත් ස්ථානගතවීම ද සෘජු හෝ වක්‍රාකාරයෙන් බලපා තිබේ.

කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ශිලාලේඛන 30 ට අධික ප්‍රමාණයක් සොයාගෙන ඇති අතර ඉන් මුල් කාලයට අයත් ශිලාලේඛන 17 ක් පමණ වේ. මෙකී ශිලාලේඛනවලින් මුල් යුගයේ කෑගල්ල දිස්ත්‍රික්කය ආශ්‍රිත ජනාවාසවීම සහ ව්‍යාප්තිය, එම ප්‍රදේශයේ ආර්ථික, දේශපාලනික, ආගමික හා සමාජීය තත්ත්වය යනාදී තොරතුරු හෙළිදරව් වෙයි. එම තොරතුරු ඇසුරෙන් කෑගල්ල දිස්ත්‍රික්කය මුල් කාලයේ පැවති ස්වරූපය අනාවරණය කිරීම මෙම පර්යේෂණ යෙන් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පදඃ- කෑගල්ල දිස්ත්‍රික්කය, ජනාවාස ව්‍යාප්තිය, ශිලාලේඛන, ඓතිහාසිකත්වය**